**කොටපොළ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 04 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කොටපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ලී බඩු හා උපකරණ ගිණුමේ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.902,595 ක් වැඩියෙන් හා ජල ගබඩා තොග ශේෂය රු.996,288 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.750,000 ක් වූ අනින්කන්ද පච්චමරම ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම් ගිණුමේ ශේෂය රු.4,330,915 ක් වැඩියෙන් දැක්වුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.152,315,964 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.100,159,271 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු නිශ්චිත ගාස්තුවලට අදාළව ගලපා තිබූ රු.255,674 හර ශේෂය පමණක් ගිණුම්වල දක්වා තිබීම සහ මුද්දර ගැස්තුවලට අදාළ රු.770,725 ක ගැලපීම් සිදුකර නොතිබීම නිසා අවිනිශ්චිත ගිණුමේ රු.515,051 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.93,232,230 ක් වූ ණයගැති ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.37,692,927 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.72,315,064 ක් වූ ණයහිමි ශේෂය තුළ, වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු. 38,549,840 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.3,948,783 ක් වූ තැන්පතු ශේෂය තුළ, වර්ෂ 03 ක කාලය ඉක්මවූ රු. 170,601 ක තැන්පතු ශේෂ ඇතුළත් වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයටත් පෙර සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනෙමින් පවතින රු.442,997 ක් වූ පිටබැද්දර ප්‍රාදේශීය සභා ණය ගිණුම, රු.327,733 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු ගිණුම හා රු.205,423 ක් වූ දේපළ ණය පොලී ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.17,796,793 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.2,854,361 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,942,432 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය

ප්‍රතිඵලයේ රු.14,942,432 ක වර්ධනයට වෙනත් ආදායම් සහ ආදායම් ආධාර හා ප්‍රතිපූර්ණ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 70 ක් ඉක්ම වූ මුළු පුනරාවර්තන වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ස්වයං උත්පාදිත ආදායම ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබූ අතර, ස්වයං උත්පාදිත ආදායම් මඟින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු.37,692,927 ක ශේෂ පැවතීමෙන් ජංගම හා ක්ෂනික අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය

----------------------

### 2.4.1 වරිපනම් හා බදු

-----------------

(අ) වරිපනම් බදු

--------------

ආරම්භක හිඟය රු.191,521 ක් වූ අතර, රු.163,551 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.355,072 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.226,936 ක් වීම නිසා 2017 ජූලි 31 දිනට රු.128,136 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) අක්කර බදු

------------

ආරම්භක හිඟය රු.238,090 ක් වූ අතර, රු.43,670 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.281,760 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.70,751 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.211,009 ක් හිඟව පැවතුණි.

### 2.4.2 ජල ගාස්තු

------------

ආරම්භක හිඟ ශේෂය රු.1,372,300 ක් වූ අතර, රු.3,280,054 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.4,652,354 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,852,894 ක් වීම නිසා 2017 ජූලි 31 දිනට තවදුරටත් රු.799,460 ක හිඟ ශේෂයක් පැවතුණි.

### 2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,053,942 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.17,654,846 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්ය සාධනය

-------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව විවිධ ප්‍රතිපාදන යටතේ රු.37,800,000 ක් වූ වැඩයෝජනා 50 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් අනුමත කර තිබුණද, වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුනේ රු.3,199,156 ක් වූ කර්මාන්ත 07 ක් පමණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.8,800,000 ක් වූ කර්මාන්ත 07 ක් අනුමත කර තිබූ අතර, ඉන් රු.5,300,000 ක් වූ කර්මාන්ත 03 ක් පමණක් ඉටුකර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත ද්විතියික මට්ටමේ තනතුරු 01 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක පැවති පුරප්පාඩු පුරවා ගැනීමට හා තනතුරු 03 ක පවතින 12 ක් වූ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේපළ ණය වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්ගෙන් අයවිය යුතු රු.205,425 ක පොලී මුදල 2016 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සභාව සතුව පැවති ප්‍රවාහන ඇණියට වාහන සහ යන්ත්‍ර 18 ක් ඇතුළත් වී තිබුණු නමුත්, එම වාහන සඳහා රියදුරන් 05 දෙනෙක් පමණක් සේවයේ යොදවා තිබුණි.

**3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) ඉඩම් හා ගොඩනැඟිලි

2015 වර්ෂයේදී රු.4,500,000 ක වියදම් දරා ඉදිකර තිබුණු බහුකාර්ය ගොඩනැඟිල්ල සහ 2001 වර්ෂයේ සභාවට ලැබී තිබූ රු.3,800,000 ක් වූ නිසල උයන ගොඩනැඟිල්ල 2017 ජුනි 30 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මෝටර් රථ හා කරත්ත

සභාව සතු පිරිවැය රු.13,774,000 ක් වූ වාහන 03 ක් වර්ෂ 09 කට වැඩි කාලයක සිට ද, රු.914,000 ක් වූ ට්‍රැක්ටරයක් 1997 වර්ෂයේ සිට ද, අක්‍රීයව පවතින නමුත්, ඒවා අලුත්වැඩියා කර ප්‍රයෝජනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණ අතර, 2015 වර්ෂයේ සභාවට ලැබී තිබුණු පිරිවැය රු.17,649,179 ක් වූ බැකෝ යන්ත්‍රය ඌන උපයෝජිතව තිබුණි.

**3.5 හඳුනාගත් අලාභ**

නාගරික සංවර්ධන අධිකාරියේ 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 5/2/2/10(ii) දරන චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් කට්ටිකර විකිණීමේදී එම විකුණන ඉඩමේ ප්‍රමාණයෙන් සියයට 10 ක ප්‍රමාණය මත සභාවට ලැබිය යුතු පර්චස් 237.24 ක ඉඩම් ප්‍රමාණයක් සභාවට අහිමි වී තිබුණි.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් 2016 වර්ෂය තුළ කසළ කලමනාකරණය වෙනුවෙන් රු.7,077,825 ක වියදම් තිබුණු අතර, කාබනික පොහොර කිලෝග්‍රෑම් 12218 ක් නිෂ්පාදනය සඳහා රු.3,923,161 ක වියදම් තිබුණු නමුත්, අලෙවියෙන් උපයාගෙන තිබුනේ රු.117,400 ක් පමණි.

**3.7 පාරිසරික ගැටළු**

2008 ජනවාරි 25 දිනැති අංක 16/1533 දරන ගැසට් නිවේදනයට අනුව කර්මාන්ත 25 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දිය යුතුව තිබුණි. ව්‍යාපාර බදු ගෙවනු ලබන ආයතන 41 ක් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.108,400 ක ආදායම් අහිමි වී තිබුණි. එමගින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම්වලට එරෙහිව සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇතුළත් වැය විෂයන් 08ක එකතුව රු.17,218,086 ක් වූ ඉතිරිවීම් ද, ආදායම් විෂයයන් 04 ක ළඟා කර නොගත් ඉලක්කවල එකතුව රු.12,953,015 ක් ද පැවතීම යන හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධාන සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ නමුත්, සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.473,448 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය